# අපූරු හීනය



සිනේජා සමරකෝන්.

# අපූරු හීනය

සිතේජා සමරකෝන්.

ISBN 978-624-206-860-2

කෘතිය පල කරන දිනය : 2023.11.15

කතෘගේ වෙනත් කෘති : දඟ මල්ලි

තෑග්ග

පින්තූර කතා

# පිදුම

මගේ ආදරණීය අත්තම්මා
සහ
ලොකු අත්තාටත්,
ආදරණීය අම්මාට
සහ
අප්පච්චිටත්,
මගේ චූටි මල්ලියාටත්,
ආදරණීය සමන්මලී ගුරුතුමියටත්
ඉතා සෙනෙහසින් පුදමි.

මෙම කෘතිය අලංකාර කරගැනීමට
සහාය දැක්වූ
චරක, ප්‍රමුදික, අනුජ, ලයාන් ,
සවිඳු, ලිනුක්, දිනෙත්,
ගවේෂ්, සවිජ යන සොහොයුරන්ට
මාගේ ස්තුතිය පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැඟීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන් ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් **"දිවිය දිනන විද්‍යුත් පොතක්** " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන් ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉතිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය මහනුවර
2023.11.01


ලස්සනට හඳ පායලා තිබුණා.
මුළු නුවර ම එළිය වෙලා.
විදුලි ආලෝකයෙන් බබළන දළදා මැදුර
හරි ම ලස්සනට පෙනුණා.
පෙරහැර දැක ගැනීමේ ආසාවෙන්
මම බලා සිටියා.



"ඔන්න වෙඩි හඬ ඇසුණා පුතේ."
තාත්තා කිව්වා.
තාත්තේ, මාව කරෙන් තියාගන්නකෝ.
එතකොට මට හොඳට පෙරහැර බලන්න පුළුවන්.
මෙච්චර ලොකු ළමයෙක් !
හා........ හා......... එන්නකෝ.
මම ඉක්මනින් තාත්තගේ කරට නැඟ ගත්තා.



තාත්තේ අර බලන්නකෝ.
අන්න බොරු කකුල් මාමලා එනවා.
උසට උසේ පාට පාට ඇඳුම් ඇඳලා.
හරි ම ලස්සනයි.
මම ආසාවෙන් එදෙස බලා සිටියා.



තාත්තේ,

ඇයි පුතේ ?

මටත් ආසයි

බොරු කකුල් මාමලා එක්ක නටන්න.

හොඳයි.... හොඳයි......

පුතා එහෙනම් නටන්න යන්නකෝ.

තාත්තා කිව්වා.



ඔය පුතා එන්නකෝ.
බොරු කකුල් මාමා මට කතා කළා.
මට ද කතා කළේ මාමේ ?
මම විමතියෙන් ඇසුවා.
ඔව් පුතේ, ඔයාටත් දෙන්න ද මේ ඇඳුම ?
ඇඳලා බලන්නකෝ.
මෙන්න බොරු කකුල් දෙක.
පරෙස්සමෙන් නගින්න මාමා කිව්වා.



ෂා ... හරි අපූරුයි.
වටපිටාව හොඳට පෙනුණා.
සුළඟට ඇඳුම එහෙට මෙහෙට සෙලවුණා.
අහසේ ඉන්නවා වගේ මට දැනුණා.



පෙරහැර බලන්නට ආ ළමයි
මා දිහා බලනවා මම දැක්කා.
එයාලා මට අත්පොළසන් දුන්නා.
ඒ සතුටට මම තවත් වේගයෙන්
නටන්න පටන් ගත්තා.



අපොයි...... වාරු නැතිවී  එකපාරට ම මාව බිම

ඇදගෙන  වැටුණා.


අම්මේ.......... අම්මේ..........

මම කෑ ගැසුවා.

මොකද දරුවෝ මේ ඇදෙන් බිමට වැටිලා ?

නැගිටින්න. නැගිටින්න.

අම්මා කිව්වා.



මම වටපිට බැලුවා.
මම සිටියේ කාමරයේ ඇඳ ළඟ බිම
මොකද දරුවෝ හීනයක් දැක්ක ද?
හා... හා.... දැන් පන්සිල් අරන් නිදාගන්න.
නැත්තම් නපුරු හීන දකිනවා. අම්මා කිව්වා.



ඕහ් ........ මම දැකලා තියෙන්නේ හීනයක් ද?
හැබැයි, මම දැක්කේ නපුරු හීනයක්නම් නෙවෙයි.
අපූරු හීනයක්.
ඒ හීනය නැවත දකින්න පුළුවන්නම්
මට හිතුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇති ව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක් ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන් ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" **දිවිය දිනන විද්‍යුත් පොතක්** " ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට
සෙනවිරත්න මහලේකම්
දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘති නිර්මාපක
2023.11.01